1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.03.12 *ගැසට් පත්‍රයේ* සහ 2004.05.14 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය නුගේගොඩ, පාගොඩ පාර, අංක 03 හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මයා, විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.12.27 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය සභා සීමාවේ රන්මුතුගල පිහිටි වැවහේනවත්ත හෙවත් අඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් මැන සැකසුණු 1983.07.05 දින හා අංක 1947 ඒ දරන පිඹුරේ කැබලි අංක 7ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 18 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක සී 390/198 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී අංක 1947/ඒ දරන පිඹුරේ කැබලි අංක 9 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
12-79/2

මහජන බැංකුව - මිනුවන්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, පන්සිල්ගොඩ ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමේ රූඩ් දෙකයි පර්චස් පහළොව (අ. 0, රූ. 2, පර්. 15) ක් විශාල බිම් කොටස. මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2010.12.22 වැනි බදාදා පෙ.ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.12.24 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2010.07.19 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.-මිනුවන්ගොඩ සිට මිනුවන්ගොඩ-වේයන්ගොඩ මහා මාර්ගයේ ඉදිරියට මීටර් 500 ක් පමණ ගිය පසු දකුණු පසින් පන්සිල්ගොඩ පාර හමුවේ. එම පාරේ මීටර් 350 ක් පමණ ගිය පසු හමුවන බුද්ධ ප්‍රතිමාව අසලින් වමට ඇති ප්‍රාදේශීය සභා පාරේ මීටර් 300 ක් පමණ ඉදිරියට ගිය පසු වම්පසට මෙම දේපළ හමුවේ.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගතහැක.

ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක : 131 නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2231901
ෆැක්ස් අංක : 033-2226165, 033-2226741

සීමාසහිත ඩලස් කෙලාට්ස් වෙන්දේසිකාර,
පුද්ගලික සමාගම,
බලයලත් වෙන්දේසිකරුවෝ.

අංක 146/3,
කල්දේරා ගාඩන්ස්,
දුටුගැමුණු වීදිය,
කොහුවල.
දුරකථන/ෆැක්ස් අංක : 011-4302622,
011-4302623,
ෆැක්ස් අංකය : 2856013.
12-140

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී එල් සී (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) වෙත උකස් කරන ලද වටිනා දේපළ

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ ගනිහිමුල්ල ගමේ පිහිටි "පොල්හේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද අංක 901 B සහ 1977.02.13 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 2 දරන බෙදා වෙන් කළ පර්චස් පහළොවකුත් දශම එකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 15.10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිත් ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේත් ඊට අයත් මාර්ග අයිතිවාසිකම් ද සමගය.

කොළඹ ප්‍රසිද්ධ ශාමිලා තිළිණි විජේරත්න විසින් ලියා සහතික කරන ලද අංක 152 සහ 2005 අප්‍රේල් මස 19 වැනි දින දරන උකස් බැඳුම්කරය මත ඉහත කී දේවාලපොළ, ගනිහිමුල්ල, අංක 9/20 දරන ස්ථානයේ පදිංචි අත්තනායක මුදියන්සේලාගේ තිලකරත්න යන අය විසින් උකස් කරන ලදුව ඔහු විසින් එකී උකස් බැඳුම්කරය මත ලබා ගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම පැහැරහැර ඇති හෙයින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව 2010.12.28 වැනි දින පෙ.ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා 2009.06.19 වැනි දින ගැසට් පත්‍රය සහ 2010.01.08 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් පුවත්පත් බලන්න.

සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% ක් (ගැණුම් මිලෙන් ඉතිරි 90% සහ ගැණුම් මිල මත අයවිය යුතු ව්‍යවස්ථාපිත හා අනෙකුත් සියලු බදු සමග වෙන්දේසියේ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු ය.)
2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාළ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වේ,

03. ගැණුම් මිලෙන් 2.5% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය,

04. ප්‍රචාරක ගාස්තුවලින් 50% ක් ගෙවිය යුතු ය,
05. ලිපිකරු සහ සෝෂක ගාස්තු 500 යි,
06. නොතාරිස් ගාස්තුව රු. 2500 යි.

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවතේ, අංක 256 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ දී පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 011-4682403, 077-3918733.

එන්. ඩී. ඩී. පී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්.

අංක 155/1, දෙහිවල පාර,
බෙල්ලන්විල,
දුරකථන අංක : 011-2731317.

12-138

ඩී එෆ් සී සී බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 73 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගර සීමාවට අයත් යටිනුවර ගඟවට කෝරළේ කටුකැලේ පිහිටි අංක 45, පේරාදෙණිය පාර යන ලිපිනය දරන, බලයලත් මිනින්දෝරු ඒ. එච්. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක 106 හා 1990 සැප්තැම්බර් මස 21 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්නය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්. 1.90 හෙවත් හෙක්ටයාර් 0.0048

එහි පිහිටි ගොඩනැගිලි ගස්වැල් වගාවන් සහ සියල්ල සහිතව

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රි විසින් සහතික කරන ලද, 2005 අගෝස්තු මස 30 වැනි දිනැති අංක 73 දරන උකස්කරය ප්‍රකාර මහනුවර "මධුරාස් ෆුඩ් සෙන්ටර්" නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන මණි නාදර් සිවා යන අය විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2010 දෙසැම්බර් මස 22 වැනි දින (බදාදා) ප. ව. 3.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. ගැණුම් මිලෙන් 12%ක් වැට් බදු (සියයට දොළහක්),
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර),
5. රු. 33,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනස් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත්, සියවසකට අධික
කලක් ශ්‍රී ලංකාවේ පිළිගත්
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය 081 : 2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011- 2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය 011- 2588176.
ඊමේල් schokman@samera1892.com
වෙබ් අඩවිය : www. schokmanandsamerawickreme.com

12-104

ලංකා බැංකුව - මධ්‍යම වෙළෙඳපොල ශාඛාව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය හා එහි සංශෝධන යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.23 දිනැති අංක. 1586 දරන *ගැසට් පත්‍රයේ* හා 2009.01.15 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2011.01.15 වැනි දින පෙ.ව. 11.30 ට කොළොන්නාව විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර, තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, වෝඩ් අංක 9, කොච්චිකඩේ දකුණ, පරණයොන් වීදියෙහි පිහිටි බලයලත් මිනින්දෝරු එෆ්. රෙයිමන්ස් විසින් සාදන ලද 1825 පෙබරවාරි 10 දිනැති මැනුමෙහි කලින් වරිපනම් අංක 116 (සහ අංක 110) සහ දැනට පරණයොන් වීදියෙහි වරිපනම් අංක 84 දරන එකී ඉඩම උතුරට පරණයොන් වීදිය ද, නැගෙනහිරට : උදුමා ලෙබ්බෙ මරික්කාර් සේකදි මරික්කාර්ට අයිති වත්තද, දකුණට : උදුමා ලෙබ්බේ මෙස්රියාට අයිති වත්තද, බස්නාහිරට : අබ්දුල්පුල්ලේ මීරා නතීජාට අයත් නිවෙසද මායිම්ව ප්‍රමාණයෙන් පර්චස් පහයි සියයෙන් පහකින්ද (අක්. 0, රූ. 0, පර්. 5 5/100) ද, සමන්විත වන අතර, ඊට අයත් සියලු දේද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඒ 1065/155 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. මාසිලාමණී විසින් සාදන ලද අංක 262 සහ 1986 ජනවාරි 27 දිනැති පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

ඉහතකී කොච්චිකඩේ දකුණ, පරණයොන් වීදියෙහි පිහිටි පරණයොන් වීදියෙහි කලින් වරිපනම් අංක 116 සහ 110 දරන ලද, වරිපනම් අංක 84 දරන අංක 262 දරන පිඹුරෙහි 'ඒ' වශයෙන් දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : පරණයොන් වීදියද, නැගෙනහිරට : පරණයොන් වීදියේ වරිපනම් අංක 88 දරන පරිශ්‍රයද, දකුණට : පරණයොන් වීදියෙහි වරිපනම් අංක 80 දරන පරිශ්‍රයද, බස්නාහිරට : පරණයොන් වීදියෙහි වරිපනම් අංක 82 දරන පරිශ්‍රය ද, මායිම්ව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහයි තුන (අ. 0, රූ. 0, පර්. 8.53) කින් සමන්විත වන අතර, එකී අංක 262 දරන පිඹුර ප්‍රකාර එහි ඇති ගහකොළ, වැවිලි ගොඩනැගිලි හා සියලු දේද අයත් වේ.

එන්. ඩී. එල්. පුෂ්පකුමාර,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මධ්‍යම වෙළඳපොල ශාඛාව.

11-119

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බාරා එන්ටර්ප්‍රයිසස්.

ගිණුම් අංක : 0031 1000 1451.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.02.25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහ තුන් ලක්ෂ හැට අට දහස් හයසිය විසි හතයි ශත හතක (රු.13,68,627.07) මුදල ද, 2009 නොවැම්බර් 26 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොළොස් ලක්ෂ තිස් දෙදහස් නමසියයක (රු. 11,32,900) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.08.13 දින රජයේ ගැසට් පත්‍රයේ, 2010.08.13 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2010.12.27 දින ප.ව. 2.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිටි කෝරළේ බෙන්තොට ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඉගල ග්‍රාමයේ ඉගල්ගොඩ 2 වැනි පටුමගේ පිහිටි වරිපනම් අංක 18/21 "පනාවෙල කුඹුර නොහොත් දහයකනුවලග ගොවිපල ලොට් 1 (අංක 640 ඒ දරන පිඹුරේ නිරූපිත පනාවෙල කුඹුර යනුවෙන් හඳුන්වනු ලබන)" හි ලොට් 2 යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. පී. ද සිල්වා යන අය විසින් සාදන ලද 1998 දෙසැම්බර් 7 දාතම හා අංක 757 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලොට් 3 සහ ලොට් 4 (කානුව), නිරිතට : ලොට් 4 (කානුව), වයඹට : එම ඉඩමේ ලොට් 1 සහ මෙම ඉඩමේ ලොට් 1 සහ අම්බලම්ගොඩ සිට අළුත්ගම දක්වා පාර සහ ගිණිකොනට : එම ඉඩමේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම බිංදුවයි එකක් (අක්. 0 රූඩ්. 0, පර්. 11.01) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ සහ සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 757 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 428/246 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

12-116/1

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

බී. කුමාරසේන - ගිණුම් අංක : 1014 5304 8023 සහ 0014 5000 8229.

බැඳුම්කර අංක 225 ප්‍රකාර රුපියල් පන්ලක්ෂ පනස් හතර දහස් හයසිය පනස් හතයි ශත අසූ නමයක (රු.554,657.89) මුදලක් ද, 2007 නොවැම්බර් 14 සිට එකී බැඳුම්කර ප්‍රකාර සම්පූර්ණ මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හය දහස් හයසිය විසිදෙකයි ශත හතලිස් හයක (රු.376,622.46) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහනමයක් (19%) බැගින් වූ පොලිය ද, සහ තවත් එක්ලක්ෂ හැත්තෑ දහස් අටසිය තිස් හතරයි ශත තිස් හයක (රු.170,834.36) මුදලක් සඳහා සියයට විස්සක් (20%) බැගින් වූ පොළිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.12.28 දින පෙ.ව. 10.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් 2009.07.31 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.07.24 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වෙල්ලබඩ පත්තුවේ දෙවිනුවර පිහිටි "හේනවත්තෙහි ලොට් 2 හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. විජේවීර යන විසින් සාදන ලද 1991 මාර්තු 30 දාතම හා අංක 4179 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 5 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 4, නැගෙනහිරට : පාර, දකුණට : එම ඉඩමේ ලොට් 5 බී සහ බස්නාහිරට : ලොට් 5 බී යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම පහයි දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 14.52) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් හා ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, එකී පිඹුරු අංක 4179 ට අනුව වෙළුම/පත්‍රිරුව බී 601/21 හි මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

12-116/2

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. පී. යූ. ජයවර්ධන.

ගිණුම් අංක : 1010 5319 9960.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 අගෝස්තු මස 04 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙලක්ෂ තිස් තුන් දහස් තුන්සිය හතලිස් එකයි ශත හැට පහක (රු.233,341,65) මුදල ද 2010 ජනවාරි මස 06 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ දහඅට දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත අසූ හතරක (රු.218,373.84) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.09.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.09.17 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.28 වැනි දින පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ග්‍රැවට් හතර මාකවිට සහ තල්පාවෙල පිහිටි "වෙඩිකාර ආරච්චිගේවත්ත, බොරළුකැටිය, වහලබරියහේන, පරගහවත්ත, ලියනරත්නගණිතගේගෙදරවත්ත, කහටගහවත්ත, ගණිතගේ වාහලබෙරියවත්ත, පරණවත්ත, වැකඩහේනේවත්ත, දෙණිය හේනවත්ත, කැටවැවඅඹගහදෙණිය, පොල්පැලකොරටුව, කුකුල්ලකොරටුව, පුංචියක්දෙස්සපදිංචිවත්ත, නැකතිගේවත්ත, මෙස්ත්‍රිසායක්කරගේ මහවත්ත, විදාගමගේහේන, කෝන්ගහකොරටුව, කඳුකපුකැබැල්ල නොහොත් හිඳකැටිය කුඹුර දැන් සියල්ල එක්ව "සනි සයිඩ් එස්ටේට්" යයි හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2006.02.16 දාතම හා අංක 89/2005 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 91 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 92, 82, සහ 83, නැගෙනහිරට : මෙහි ලොට් 83 සහ 90 දකුණට : මෙහි ලොට් 90 සහ 42 සහ බස්නාහිරට මෙහි ලොට් 42 සහ 92 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම අටයි පහක් (අක්. 0, රූඩ්. 0, පර්. 10.85) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන් ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ එකී අංක. 89/2005 දරන පිඹුරට අනුවය.

බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2004.06.28 වැනි දාතම හා අංක 345/2004 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි උප බෙදුමක් සහ නැවත මිනුමක් වන එකී ලොට් 91 පහතින් විස්තර කොට ඇති පරිදිය.

එකී මාකවිට සහ තල්පාවෙල පිහිටි "වෙඩිකාර ආරච්චිගේවත්ත, බොරළුකැටිය, වාහලබරියහේන, පරගහවත්ත, ලියනරත්නගණිතගේ ගෙදරවත්ත, කහටගහවත්ත, ගණිතගේ වාහලබෙරියවත්ත, පරණවත්ත, වැකඩහේනේවත්ත, දෙණිය, හේනවත්ත, කැටවැව, අඹගහ, දෙණිය, පොල්පැලකොරටුව, කුකුල්ලකොරටුව, පුංචියක්දෙස්ස්පදිංචිවත්ත, නැකතිගේවත්ත, මෙස්ත්‍රිසායක්කාරගේ, මහවත්ත, විදාගමගේ හේන කෝන්ගහකොරටුව, කඳුකපුකැබැල්ල නොහොත් හිඳකැටිය කුඹුර දැන් සියල්ල එක්ව "සනි සයිඩ් එස්ටේට්" යයි හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2004.06.28 වැනි දාතම හා අංක 345/2004 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කෝන්ගහවත්ත, කහටගහවත්තෙහි කොටසක්, මඩවලදෙණිය පිංකොරටුව සහ මාරගහවත්ත නැගෙනහිරට : මාරගහවත්ත, ගම් සහා පාර, මහපිංදෙණියගෙදරවත්ත, පාර සහ මහගෙදරවත්ත, ලොට් 4, ලොට් 2 වෙන්කරන ඇල දකුණට : ඇල, දෙල්ගහහේන, බතලවත්ත, මහපිංදෙණියගෙදර වත්ත, පාර, මහගෙදරවත්ත සහ විදානගමගේහේන, සහ බස්නාහිරට : කහටගහ වත්තෙහි කොටසක් කොන්ගහවත්ත, වාහලබෙරියහේන, විදානගමගේහේන, විදානගමගේ කුඹුර සහ මහ පිංදෙණියගෙදර වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තිස්එකයි රූඩ් තුනයි පර්චස් තිස් පහයි දශම බිංදුවයි තුනක් (අක්. 31, රූඩ්. 3, පර්. 35.03) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුමදේ එකී අංක 345/2004 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 510/09 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහතින් විස්තර කොට ඇති පරිදි බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2004.06.28 වැනි දාතම හා අංක 345/2004 දරන පිඹුරේ නිරූපිත ලොට් 4, එකී අංක 89/2005 දරන පිඹුරේ නිරූපිත ලොට් 42, 128, 62 1/2, 247, 319 දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

12-116/3

ලංකා බැංකුව - ආණමඩුව ශාඛාව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ආණමඩුව, තට්ටව පදිංචි අබේරත්න හේරත් මුදියන්සේලාගේ ආරියරත්න විසින් උකස් කරන ලද දේපළ

ණය යොමු අංකය : 6176516.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.09.09 වැනි දිනැති අංක 1671 දරන *ගැසට් පත්‍රයේ* හා 2010.09.01 දිනැති ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවියයුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද, අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2010.12.30 වැනි දින පෙ.ව. 10.30 ට හලාවත, රදගුරු මාවත, අංක 4 ඩී හි පදිංචි වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රිකක්යේ, කුමාරවන්නි පළාතේ, කරඹේ පත්තුවේ, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බම්මන්නෙගම අංක 653 ඩී දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බම්මන්නෙගම පිහිටි රජයේ බදු ඉඩම අක්කර එකක් සහ රූඩ් එකක (අක්. 1, රූඩ්. 1, පර්.0) බිම් ප්‍රමාණයකින් යුක්තව උතුරට "දෙවට පාර ද " නැගෙනහිරට බම්මන්නෙගම පාර ද, දකුණට : ආර්. එච්. එම්. හේරත් බණ්ඩාගේ ඉඩම ද, බස්නාහිරට ඒ. පී. සිරිසේනගේ ඉඩම ද, මායිම්ව පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O.140/229 හි ලියාපදිංචි කර ඇත. මෑතක දී කරන ලද නැවත මැනීමක් මගින් එකී ඉඩම බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සාදන ලද 2006.12.23 වැනි දිනැති අංක. 443/06 දරන පිඹුරෙහි ලොට් අංක 1 ලෙස නිරූපනය කර ඇති අතර, අක්කර එකයි රූඩ් එකක (අක්. 1, රූඩ්. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්තව, උතුරට : අඩි පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට :ලොට් අංක 2 ද සහ බස්නාහිරට: ඒ. පී. සිරිසේනගේ ඉඩම ද මායිම් වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,
කේ. පී. සී. එස්. රාජපක්ෂ,
කළමනාකරු.

ලංකා බැංකුව,

12-120

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : පීජීපී/02/02291/කේ2/997.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2010.05.21 *ගැසට් පත්‍රයේ* සහ 2010.08.16 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනිම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය නුගේගොඩ, පාගොඩ පාර, අංක 03හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මයා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.12.27 වැනි දින පෙරවැර 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ (ගලහිටියාව උප කාර්යාලය) ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ තිබ්බොටුගම පිහිටි පොල්හේන නොහොත් කොරසකැලේ ඉඩමට 1989.12.05 වැනි දින බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් මැන සකසන ලද අංක 2593 දරන පිඹුරේ කැබලි අංක 09 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 10.7 ක් වූ බිම් කොටස.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 265/43 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 2593 දරන පිඹුරේ කැබලි අංක 13 (මාර්ග අයිතිය සමඟ) සහිත කොටස වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-79/1

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - බෙලිඅත්ත ශාඛාව

(කලින් රුහුණ සංවර්ධන බැංකුව ලෙස හැඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2010.12.27 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණ පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, ගලගම පිහිටි පැලවත්ත නමැති ඉඩම අයි. කොටඹගේ බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද 2003.06.10 වැනි දින අංක 4945 දරන පිඹුරේ ලොට් 01 ලෙස පෙන්නුම් කරන ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් තිස් නවයයි දශම හතක් (අ. 1, රූ. 0, පර්. 39.7) ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලු වැවිලි සහ ගොඩනැගිලි වේ.

වැඩි විස්තර සඳහා 2008.03.07 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2008.06.03 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.- බෙලිඅත්ත-දික්වැල්ල පාරේ කි. මී. 06ක් පමණ ගොස් පාරේ දකුණු පසට ඇති ගලගම පාරේ කි. මී. 01ක් ඉදිරියට ගොස්, ගලගම මහ විදුහල පසුකර දකුණු පසට වැටී ඇති පාසල් මාවතේ මී. 200ක් පමණ ගිය විට මෙම දේපළ හමු වේ

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතු ය :-

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන්න විකුණුම් මිලෙන් 2 1/2ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ, දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීතුමාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නෙගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 04-2231532, 2226208, 2226209, 047-2243423.

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකාර,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංකය : 041-2228731, 0714438516.
12-115

හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී - මොරටුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2007.10.12 සහ 2007.12.17 දිනැති සහ පිළිවෙලින් අංක 8057 සහ 8166 දරන බැඳුම්කරයන් යටතේ (පහත පලවන උපලේඛනයේ සඳහන් පරිදි) අය විය යුතු මුදල් ගෙවීම සුනිල් බස්නායක සහ හේවා දේවගේ ප්‍රියන්ති ප්‍රනාන්දු යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් සහ මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 1997.10.12, 2003.09.24 සහ 2006.09.15 වැනි දින සහ පිළිවෙලින් අංක 2967, 6036 සහ 7590 දරන බැඳුම්කරයන් යටතේ (පහත දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු මුදල් ගෙවීම සුනිල් බස්නායක (තනි අයිතිකරු බස්නායක ලි වෙළඳසැල) යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින පිළිවෙලින් ප. ව. 2.30 ට සහ ප. ව. 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1 වැනි උපලේඛනය .- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාව තුළ කටුකුරුන්ද කටුකුරුන්ද පාරේ, කොරමාදෙන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. එස්. සී. විතානගේ විසින් 2007.06.28 වැනි දින මැන සාදන ලද අංක 918 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 11.78.

2 වැනි උපලේඛනය .- බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාව තුළ මොරටුවැල්ල ෆ්‍රෙසර ඇවනිව්, වර්ෂනම් අංක 26/5 නමැති බලයලත් මානක ඒ. සී. එස්. විතානගේ විසින් 1994.11.17 වැනි දින මැන සාදන ලද අංක 155 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 6.60.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.11.12 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2010.11.15 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම .- 1 මොරටුව දුම්රිය ස්ථානය පසුකොට නව ගාලු පාරේ මීටර් 300ක් පමණ ගියවිට අදාළ දේපළ හමු වේ.

ඉඩමට පිවිසීම.- 11. මොරටුව සිට කොරලවැල්ල පාර, දකුණු අත පැත්තේ පිහිටි "ආර්නෝල්ඩා පෙදෙස" දක්වා කිලෝ මීටර් 4 ක් පමණ ගමන් කරන්න. ආර්නෝල්ඩා පෙදෙස ඉදිරිපිට මහපාරට මුහුණලා වම් අත පැත්තේ අදාළ දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661826, 2661835 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු).
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714 - 424478.
ෆැක්ස් අංකය : 0114 - 617059.
12-125

නිවැරදි කිරීමයි

සෙලාන් බැංකුව පීඑල්සී - මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම 2010 නොවැම්බර් මස 19 වැනි දින පළ වූ අංක 1681 දරන රජයේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටස (II අ) වැනි ඡේදය - පළකිරීමේ කොටසෙහි වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් යටතේ සෙලාන් බැංකුව මොරටුව ශාඛාව යටතේ වූ ගැසට් නිවේදනයේ සඳහන් දේපළ දෙක වෙන්දේසි කිරීමේ දිනය 2010 දෙසැම්බර් මස 14 වැනි දින පෙරවරු 10.00 සහ 2010 දෙසැම්බර් මස 14 වැනි දින පෙරවරු 10.45 යන්න 2011 ජනවාරි මස 12 වැනි දින පෙරවරු 10.00 සහ 2011 ජනවාරි මස 12 වැනි දින පෙරවරු 10.45 යනුවෙන් නිවැරදි විය යුතු ය.

තුසිත කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 2572940.
12-126

ලංකා බැංකුව - මදුරන්කුලිය ශාඛාව

ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය හා එහි සංශෝධන යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

* මදුරන්කුලිය වේලාසිය පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ ලෙනි ප්‍රියන්ති මහත්මිය, ජයසුන්දර මුදියන්සේලාගේ නිලකරත්න මහතා සහ ලියනගේ විමලාවති පෙරේරා මහත්මිය විසින් උකස් කරන ලද දේපළ.

ණය යොමු අංකය : 5142236, 7419684.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.03.06 දිනැති අංක. 1592 දරන ගැසට් පත්‍රයේ හා 2009.02.27 වැනි දිනැති දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද, යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මූල් මුදලේ ශේෂය ද, විකිණීමේ කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2010.12.23 වැනි දින පෙ.ව. 10.30 ට හලාවත රදගුරු මාවත, අංක 4ඩී හි පදිංචි වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මදුරන්කුලිය ග්‍රාමසේවක කොට්ඨාසයේ, පුත්තලම් පත්තු දකුණ, මදුරන්කුලියේ පිහිටි "අට්ටවිල්ලුකලේ" ලෙස ප්‍රසිද්ධ හා නමැති රජයේ බදු ඉඩම සර්වේයර් ජනරාල් විසින් සාදන ලද අංක Aa, Ja, Pi, Pu/4 දරන පිඹුරෙහි ලොට් අංක 56 ලෙස දක්වා ඇති අතර, අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් විසිඅටක (අ. 2, රූ. 2, පර්. 28) වපසරියකින් සමන්විතව උතුරට ලොට් 21 සහ 14 ද, නැගෙනහිරට ලොට් අංක 22 සහ 55 ද, දකුණට ලොට් අංක 50 සහ 55 ද, බස්නාහිරට ලොට් අංක 19 ද, සහිතව මේ මායිම් තුළ වූ සියලු දේ වේ. මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O.26/107 හි ලියාපදිංචි කර ඇත.

ඉන්පසුව කරන ලද මැනීමකට අනුව, සර්වේයර් ජනරාල් වෙනුවෙන් පුත්තලම මිනින්දෝරු අධිකාරී විසින් සාදන ලද 2003.05.22 දිනැති අංක Aa, Ja, Pi Pu/4 දරන එකී පිඹුරෙහි ඉහත කී ඉඩම අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් විසිඅටක (අ. 2, රූ. 2, පර්. 28) වපසරියකින් යුක්ත වන අතර, උතුරට ලොට් 21 ද, නැගෙනහිරට ලොට් අංක 22 සහ 55 ද, දකුණට ලොට් අංක 50 සහ 55 ද, බස්නාහිරට ලොට් අංක 19 ද මායිම් වේ.

2. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු කොට්ඨාසයේ, පුත්තලම්පත්තු දකුණෙහි, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මදුරන්කුලිය 608 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මදුරන්කුලිය, වේලුසුමනපුර පිහිටි "අට්ටවිල්ලුකලේ" ලෙස ප්‍රසිද්ධ සහ නමැති රජයේ බදු ඉඩම් කොටස, සර්වේයර් ජනරාල් විසින් සාදන ලද Aa, Ja, Pi Pu /4 දරන පිඹුරෙහි ලොට් 86 ලෙස දක්වා ඇති අතර, එය අක්කර පහයි පර්චස් තිස්නවයක (අ.5, රූ. 0, පර්.39) වපසරියකින් සමන්විතව, උතුරට ලොට් 50 පාර ද, නැගෙනහිරට ලොට් අංක 87 ද, දකුණට ලොට් අංක 95 සහ ලොට් අංක 96 1/2 ද, හි කොටසක් ද, සහ බස්නාහිරට ලොට් අංක 85 ද යන මායිම් තුළ ඇති සියල්ල වේ. මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O. 22/46 හි ලියාපදිංචි කර ඇත.

ඉන්පසුව කරන ලද මැනීමකට අනුව ඉහත කී ඉඩම ඉහත කී අංක A, Ja, Pi Pu /4 දරන පිඹුරෙහි ලොට් අංක 86 ලෙස දක්වා ඇති අතර, එය අක්කර පහයි පර්චස් තිස් නවයක (අ. 5, රූ. 0, පර්. 39) වපසරියකින් සමන්විතව, උතුරට ලොට් අංක 50 - පාරද, නැගෙනහිරට ලොට් අංක 87 ද, දකුණට ලොට් අංක 95, සහ ලොට් අංක 96 1/2 කොටසක්ද, බස්නාහිරට ලොට් අංක 85 ද මායිම් වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඩබ්. ජී. ටී. එච්. යූ. කුමාරිහාමි,
කළමනාකරු.

ලංකා බැංකුව.
12-118

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 644

D/22/NY/458.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාණ්ඩර් (අවි) සේනසිගේ ජූඩ් ෂෙනායි නිරන්ජන් සිල්වා, ශ්‍රීලංනාහ - එන්ආර්එස්ස් 0518

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව් ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.
12-84

2010 අංක 645

D/RF/824/NY/1/9.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2009 මාර්තු මස 01 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාන්ඩර් (නාසේ) වශයෙන් :

ලුතිනන් (නාසෙ) මුනිපුරග් උදයවීර කුමාරණතුංග, එන්ආර්පී 1270, ශ්‍රීලංනාහ

2009 අප්‍රේල් මස 04 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාණ්ඩර් (වී) වශයෙන් :

ලුතිනන් (වී) ඉලංගසිංහ බ්‍රාහ්මණ මුදියන්සේලාගේ මාලිකා තිලක්ෂිණි තිලකරත්න, එන්ආර්එල් 1401, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව් ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.
12-85

2010 අංක 646

D/VF/193/NY/1.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2010 ජනවාරි මස 01 සිට කපිතාන් වශයෙන් :

කොමාණ්ඩර් (තාවකාලික කපිතාන්) අප්පුහාමිගේ හේරත්බංඩා, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑස් 5071

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව් ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.
12-82

2010 අංක 647

D/VF/193/NY/1.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2009 ජූලි මස 30 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් අලහේන්ද් ආරච්චිගේ නාලිකා තුෂන්ති පෙරේරා, එන්වීඑස් 5273, ශ්‍රීලංස්වේනාහ

2009 දෙසැම්බර් මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් විරසිංහ මුදියන්සේලාගේ කෝසල රවිනාත් විරසිංහ, එන්වීඑස් 5247, ශ්‍රීලංස්වේනාහ

ලුතිනන් හේරත් බංඩාර මුදියන්සේලාගේ මංගල විජේරත්න, එන්වීඑස් 5260, ශ්‍රීලංස්වේනාහ

ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ නිහාල් දිසානායක, එන්වීඑස් 5261, ශ්‍රීලංස්වේනාහ

ලුතිනන් කෝණාර මුදියන්සේලාගේ දයානන්ද, එන්වීඑස් 5262, ශ්‍රීලංස්වේනාහ

ලුතිනන් තිස්සකුට්ටි ආරච්චිගේ පියරත්න, එන්වීඑස් 5264, ශ්‍රීලංස්වේනාහ

ලුතිනන් මල්ලිකාආරච්චිගේ දොන් වසන්ත, එන්වීඑස් 5267, ශ්‍රීලංස්වේනාහ

ලුතිනන් සෙනරත් පතිරණගේ නිල්මිණි සුජීවා, එන්වීඑස් 5268, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව් ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.
12-81

2010 අංක 648

D/VF/194/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

2007 ජූනි මස 26 වැනි දින සිට ලුතිනන්, තොරතුරු නාක්ෂණ (ස්වේච්ඡා) වශයෙන් :

එරන්ද මාලක චන්ද්‍රදාස, එන්වීටී 5429

2007 ජූනි මස 26 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් තොරතුරු නාක්ෂණ (ස්වේච්ඡා) වශයෙන් :

හොඳුමුනි දේවේන්ද්‍ර රුෂාන් මෙන්ඩිස් කරුණාරත්න, එන්වීටී 5430

2007 ජූනි මස 26 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන් :

කෝරලේ ලියනගේ ගානිකා දිල්රුක්ෂි ලියනගේ, එන්වීඑස් 5431

2007 ඔක්තෝබර් මස 15 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන් :

කංකානම් ගමගේ ශ්‍රීමන්ත නිර්බාධ, එන්වීඑස් 5433
මාධව ගජනාත් වන්නිආරච්චි, එන්වීඑස් 5434
රෝහණ සුමනසේකර, එන්වීඑස් 5435
හේරත් මුදියන්සේලාගේ කීර්ති බණ්ඩාර, එන්වීඑස් 5436
කොඩිතුවක්කු ආරච්චිලාගේ ලලිත් කොඩිතුවක්කු, එන්වීඑස් 5437
මැදගෙදර චිත්තක සඳරුවන් කොඩිතුවක්කු, එන්වීඑස් 5438
මඩම්පැල්ලේ ගුණරත්න මුදියන්සේලාගේ සම්පත් පද්ම කුමාර ගුණවර්ධන, එන්වීඑස් 5439
දොන් චන්දන වනිගරත්න, එන්වීඑස් 5440
සෙනරත් රත්නායක උපුල් චමින්ද රත්නායක, එන්වීඑස් 5441
අලහකෝන් මුදියන්සේලාගේ රොෂාන් බංඩාර අලහකෝන්, එන්වීඑස් 5442
මොහමඩ් නිලාම් අන්වර්, එන්වීඑස් 5443
රසික ඉන්දික දේවේන්ද්‍ර, එන්වීඑස් 5444
රයිගම ආචාරිගේ අසංක සම්මි කුමාර, එන්වීඑස් 5445
දිසානායක මුදියන්සේලාගේ කීර්තිරත්න බංඩාර, එන්වීඑස් 5446
අත්තනායකගේ රංග මොහාන් කුමාර, එන්වීඑස් 5447
සුන්දරා වඩුගේ ඩෙසිල් ප්‍රසාත්, එන්වීඑස් 5448
චන්දන රුවන් ගමගේ, එන්වීඑස් 5449
ගනේගෙ රසික විපුල් කුමාර, එන්වීඑස් 5450

2008 මැයි මස 08 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන් :

වල්පොලගේ දොන් කපිල නලින් කුමාර වල්පොල, එන්වීඑස් 5479
ඇල්ලේපොල ගෙදර අසේල ප්‍රදීප් කුමාර, එන්වීඑස් 5480
දඹගහ මඩේ ගෙදර ධම්මික කුමාර ප්‍රේමචන්ද්‍ර, එන්වීඑස් 5481
තෙන්නකෝන් මුදියන්සේලාගේ චන්දිම කපිල සෙනෙවිරත්න, එන්වීඑස් 5482
අර්ෂනිලගේ දොන් ජානක ප්‍රසන්න ප්‍රනාන්දු, එන්වීඑස් 5483
මාන්නපෙරුම මුදියන්සේලාගේ හේමන්ත කුමාරසිරි, එන්වීඑස් 5484
සිරි ජයලත්ගේ සිසිර උදය කුමාර, එන්වීඑස් 5485
හෙට්ටි ආරච්චිලාගේ ප්‍රසන්න රත්න කුමාර, එන්වීඑස් 5486
දිසානායක මුදියන්සේලාගේ නලීන් සමන් කුමාර දිසානායක, එන්වීඑස් 5487
රාජපක්ෂගේ රනිල් ලසන්ත වර්ණසූරිය, එන්වීඑස් 5488
සුරේෂ් විධාන පතිරණ, එන්වීඑස් 5489
පතිරනගේ රවින්ද්‍ර පුෂ්ප කුමාර, එන්වීඑස් 5490
මෙස්ටියගේ දොන් නිශ්ශංක ගුණතිලක, එන්වීඑස් 5492
මංත්‍රී දේවගේ ගාමිණී සරත් කුමාර, එන්වීඑස් 5493
ගුණසේකර සමරසිංහගේ ජනක අනුරාධ, එන්වීඑස් 5496

2008 මැයි මස 09 වැනි දින සිට උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන් :

වෙන්ගප්පුලි ආරච්චිගේ පද්මසිරි, එන්වීඑස් 5498
මෙරෙඤ්ඤ ලලිත්, එන්වීඑස් 5499
කාලිංග පර්සි අමරසිංහ, එන්වීඑස් 5500
ඇලගෙදර වත්තේගේ නිශාන්ත බංඩාර ගුණරත්න, එන්වීඑස් 5501
වීරක්කොඩිගේ පියසිරි, එන්වීඑස් 5502
එෂාන් උපුල් කුමාර කොඩිප්පිලිආරච්චි, එන්වීඑස් 5503
අංකිලි පිටියේ ගෙදර විජේරත්න, එන්වීඑස් 5504
රත්මලානගේ අතුල නිරංජන් ප්‍රනාන්දු, එන්වීඑස් 5505
අමරසිංහ සිල්වාගේ ඇලෙක් රොහාන් ද සිල්වා, එන්වීඑස් 5506
කෝදාගොඩ පතිරගේ අජිත් ශාන්තප්‍රිය, එන්වීඑස් 5507
තිස්සේදෙණියේ ගෙදර ලක්ෂ්මන් චන්ද්‍රරත්න, එන්වීඑස් 5508
කුමාරගේ ලක්ෂ්මන්, එන්වීඑස් 5509
මුණසිංහ අනුර චන්දන පියතිලක සිල්වා, එන්වීඑස් 5510
මුතුකුට්ටිගේ පියසිරි පෙරේරා, එන්වීඑස් 5511
කොඩිතුවක්කු කන්කානම්ගේ ලලිත් කුමාර, එන්වීඑස් 5512
මධුර ආරච්චිගේ ජයවික්‍රම, එන්වීඑස් 5513
සකලසූරිය මුදියන්සේලාගේ රණසිංහ බණ්ඩාර, එන්වීඑස් 5514

2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන් :

අනුරාධ ජයසිංහ, එන්වීඑස් 5515
කොහොඹගහ ගෙදර සුනිල් ප්‍රියදර්ශණ විජේරත්න, එන්වීඑස් 5516
හේනෙගම මුතුකුමාරගේ ප්‍රියන්ත, එන්වීඑස් 5517
රණසිංහ මුදලිගේ මංජුල ප්‍රසන්න රණසිංහ, එන්වීඑස් 5518
චමිලා වුලනී ඛයමන්තිනා දුම්නගු විතානගේ, එන්වීඑස් 5519

2008 සැපැත්ම්බර් මස 03 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන් :

හේවානායක මුදියන්සේලාගේ වරුණි කෞශල්‍යා, එන්වීඑස් 5520
මෙරිඤ්ඤගේ දොන් කමනි ඉන්දිකා පෙරේරා, එන්වීඑස් 5521
ඕවිට්ගල විතානගේ දෝන නිරාශා අමන්ති, එන්වීඑස් 5522
ඉෂෙයි ෂැනෝරා හජ්ජි, එන්වීඑස් 5523
සමරසේකර මුදියන්සේලාගේ දීපානි නිලූකා කුමාරි සෙනවිරත්න, එන්වීඑස් 5524
අගලකඩ ආරච්චිගේ නිලූෂා දමයන්ති, එන්වීඑස් 5525
පහලගෙදර චන්නිආරච්චිගේ ශාමලී ඉන්දිකා, එන්වීඑස් 5526
කංකානම්ගේ ඉනෝකා දමයන්ති, එන්වීඑස් 5527
සිංහලගේ නදීකා සංජීවනී කරුණාතිලක, එන්වීඑස් 5528
පතිරාජ මුදියන්සේලාගේ වසන්ති පතිරාජ, එන්වීඑස් 5529

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව්. ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.
12-83

2010 අංක 649

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිනිය ඇයගේ නාවිකාධිපතියන් දක්වා ඇති දින සිට තාවකාලික විංග කමාණ්ඩර් නිළයට උසස් කෙරේ :

ස්කොඩ්‍රන් ලීඩර් වලිමුණි කුමුදු මෙන්ඩිස් වීරසේකර (ස්/0509) දන්ත වෛද්‍ය
2007.07.19

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව් ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය අමාත්‍යාංශය.

2010 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.
12-87

2010 අංක 650
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්
පහත නම සඳහන් නිලධාරිනිය ඇයගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිළයට උසස් කෙරේ :
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ඉනෝකා ජීවන්ති සේනාරත්න (ඕඩබ්/01073) උපකරණ - 2010.06.27
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.
2010 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.
12-88

2010 අංක 651
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්
පහත නම සඳහන් නිලධාරිනිය ඇයගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිළයට උසස් කෙරේ :
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මොනිකා චාමිනි ගමගේ (ඕඩබ්/01068) උපකරණ - 2010.06.27
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.
2010 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.
12-89

2010 අංක 652
ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව
අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්
පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ස්ථිර විංග කමාණ්ඩර් නිළයට උසස් කෙරේ :
තාවකාලික විංග කමාණ්ඩර් කැලිස්ටස් රෝහිත ඩයස් ගුණවර්ධන (වී/0313)
පාරිපාලන රෙජිමේන්තුව - 2010.06.02
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය අමාත්‍යාංශය.
2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
12-86

රජයේ නිවේදන

ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව
1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත
අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 39 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය තුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මාණ්ඩලියීය දෙපාර්තමේන්තුව,

2010 නොවැම්බර් මස 15 වැනි දින,
අංක 80, සාංචිආරච්චි වත්ත,
අධිකරණ මාවත,
කොළඹ 12.
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්පත් අංකය	ණයකරුගේ නම සහ ලිපිනය	ණයහිමියාගේ නම සහ ලිපිනය
(01) 41458	ජයමහ මුදලිගේ දෝන මේරි ඩොට් වයලට් මිය, අංක 90, බෝපිටිය, පමුණුගම	ගීකියනගේ කාන්ති ප්‍රනාන්දු මිය, අංක 352, උස්වැටකෙයියාව, පල්ලියවත්ත, පමුණුව
(02) 41494	01. ලියන ආරච්චිගේ ගීනාත් දීප්ති ප්‍රනාන්දු මහතා 02 පූජ්‍ය පානදුරේ ධම්මතිස්ස හිමි (ගිහිකළ ලියනආරච්චිගේ මෙන්දිස් ප්‍රනාන්දු) අංක 186, ගාලු පාර, පානදුර	සෝමවන්ද ඉන්වෙස්ටිමන්ට් පෞද්ගලික ආයතනය, අංක 40, ගාලු පාර, මහ වස්කඩුව, වස්කඩුව
(03) 41627	කුරුකුලසූරිය ලලින්ද ප්‍රදීප් ලූෂන් ප්‍රනාන්දු වෙනුවෙන් ඇටෝර්නි බලකාරිය වීරක්කොඩි ආරච්චිගේ දෝන ග්‍රේෂ් අයිරින් පැට්‍රිෂියා මිය, අංක 175, බණ්ඩිරිප්පුව පාර, හාල්දඬුවන, ලුණුවිල	සීමාසහිත සමගි එස්ටේට් ඇන්ඩ් ෆිනෑන්ස් (පුද්) සමාගම, අංක 85, හලාවත පාර, වෙන්නප්පුව

ඉල්ලුම්පත් අංකය	ණයකරුගේ නම සහ ලිපිනය	ණයහිමියාගේ නම සහ ලිපිනය
(04) 41696	සුදුවා දේවගේ අනුෂ්කා ප්‍රියංගනී මිය, ඒ. එස්. එම්. සී. අත්තනායක බාරේ, අංක 115/බී, මාළිද, කපුගොඩ	රූපසිංහ ආරච්චිගේ දොන් වරුණ සම්පත් මයා, අංක 167/ඒ, ජයන්ති හන්දිය, මිරිස්කන්ද වත්ත, දොම්පේ
(05) 41725	වර්ණකුලසූරිය ඉච්චම්පුල්ලිගේ ජයශ්‍රී ඔගස්ටස් රොහාන් ප්‍රනාන්දු මයා, අංක 320, රොහාන් විලා, නැගෙනහිර නයිනමඩම, නයිනමඩම	අඹගහගේ ටිරොන් ප්‍රභාත් සුරංග ප්‍රනාන්දු මයා, පේරගස් හන්දිය පාර, කොලින්ජාඩිය, වෙන්නප්පුව
(06) 41731	රාජකරුණා දේවයලාගේ සෝමාවතී මිය, අංක 55. රම්බොඩගල්ල, පානගමුව	හෙට්ටිවාන දේවගේ මැංචිනා චන්ද්‍රසීලි මිය, ගල්ලව, ඊරියගල්ල
(07) 41734	කුනන්කාර ගෙදර කරුණාදාස මයා, අංක 143, දංගමුව, මාරස්සන	එගොඩ ගෙදර ඉන්දික පද්මසිරි මයා, අපොන්සුවත්ත, මයිලපිටිය
(08) 41735	කංකානම් පතිරණගේ තුෂාර සංජීව මයා, අංක 56/13, තුම්බෝවිල, පිළියන්දල	මුතුමුණි තුෂාරි ප්‍රියංකා ද සිල්වා මිය, අංක 171, දුම්රියපල අසල, නාපේ, කොස්ගොඩ
(09) 41747	ලොකු විජයසිංහලාගේ සුමනාවතී මිය, කෝප්‍රල් ජයදේව මාවත, පාසැල් පෙදෙස, මංඩාවල	එදිරිසිංහ පතිරණගේ අජිත් කුමාර මයා, අංක 217 ඊ, අක්කර නමය පාර, මංඩාවල
(10) 41757	රණතුංග ආරච්චිගේ ඉඳුනිල් චන්දන මයා, අංක 19, ශ්‍රී ධර්මපාල පාර, ගල්කිස්ස	පැස්කුවල් හැන්නැදිගේ රාණී වෛද්‍යතිලක මිය, අංක 21/1, ශ්‍රී ධර්මපාල මාවත, ගල්කිස්ස
(11) 41761	තල්පෙ හේවගේ ශ්‍රියාලතා මිය, පල්ලියපිටිය, රත්ගම	මේරි නෙලුම්කා ජයලත් මිය, පල්ලියපිටිය, රත්ගම

12-110

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ඩී එෆ් සී සී බැංකුව
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. කේ. ලොකුගේ සහ එස්. වී. පී. කුරේ විසින් සහතික කරන ලද 2007.08.27 සහ 2008.03.31 දින හා අංක 700 සහ 1302 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කුරුණෑගල පදිංචි වර්ණකුලසූරිය ආරච්චිගේ දෝන දීපා ගයාත්‍රි රණසිංහ සහ ලසන්ත සංජීව රණසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.07.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස්ලක්ෂ හැටතුන් දහස් තුන්සිය පනස් අටයි ශත අසූ දෙක (රු. 30,63,358.82)ක සහ රුපියල් පන්ලක්ෂ අනූහත් දහස් හයසිය විසි එකයි ශත දොළහ (රු. 5,97,621.12) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 700 සහ 1302 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එක්දහස් හයසිය හැත්තෑ අටයි ශත පනස් පහ (රු. 1,678.55)ක් සහ රුපියල් තුන්සිය හැත්තෑහයයි ශත පනස් අට (රු. 376.58) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, දෙවන මහල, අංක 53හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ. අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභාවේ, බටගම උතුර ග්‍රාමයේ පිහිටි ජා-ඇල ගනේමුල්ල පාරේ වරිපනම් අංක 226 පිහිටි ඉල්ලුක්කැල්ල හෙවත් පුවක්වත්තකැල්ල නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. නන්දසේන විසින් සකසන ලද 2007.07.21 දිනැති හා අංක 2648 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 648/181 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද එකී අංක එච්/798 පිඹුරේ කැබලි අංක 29 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-80/1

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : කේ4/4463/කේවයි3/782, කේ4/7773/කේවයි4/596.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. ඊරියගම සහ ඒ. එන්. ඕපාත විසින් සහතික කරන ලද 2002.02.01 දින සහ 2007.11.26 දින හා අංක 392 සහ 621 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, හන්දෙස්ස පදිංචි සංඝරාජගේ චන්දන දිසානායක සහ ජයවර්ධන ගෙදර දිලානි චන්ද්‍රලතා ජයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.07.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ විසිදෙදහස් හැත්තෑ හයයි ශත පනස් දෙක (රු. 2,22,076.52)ක සහ රුපියල් හයලක්ෂ අනූහතර දහස් තුන්සිය අසූහතයි ශත පනස් හය (රු. 6,94,387.56) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 392 සහ 621 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසි එකයි ශත හැට නවය (රු. 121.69)ක් සහ රුපියල් තුන්සිය අසූවයි ශත හතලිස් නවය (රු. 380.49) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවියට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ පළාත, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ, හන්දෙස්ස පිහිටි පිටකොටුවෙහේන නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. එම්. ජී. මුණසිංහ විසින් සකසන ලද 1998.03.22 වැනි දිනැති හා අංක 1955 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 18ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 356/64 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-80/2

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : එස්-7/75121/ඩී7/531, එස්-7/76119/එස්ඕ2/041.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. ජයවර්ධන විසින් සහතික කරන ලද 2004.05.24 දින සහ 2005.12.08 දින හා අංක 483 සහ 591 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පල්ලෙබැද්ද පදිංචි ඌරලගමගේ ධර්මප්‍රිය හෙවත් ඌරලගමගේ ධර්මසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ පනස් දහස් හාරසිය අසූ අටයි ශත හැට දෙක (රු. 4,50,488.62)ක සහ රුපියල් තුන්ලක්ෂ නමදහස් තුන්සිය එකයි ශත අසූහය (රු. 3,09,301.86) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 483 සහ 591 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අනූ හතරයි ශත තිස් නවය (රු. 194.39)ක් සහ රුපියල් හැත්තෑ දෙකයි ශත පනස් පහ (රු. 72.55) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මහනුවර, හීරැස්සගල, බෝවලවත්ත පාර, මවුන්ට් ප්ලසන්ට් ගාඩ්න්ස්, අංක 432/1හි බලයලත් වෙන්දේසිකාර ජේ. ඩබ්. ජයසූරිය මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, තඹගම්පත්තුවේ, අටකලන්පන්න ප්‍රාදේශීය සභාවේ, ගොඩකවෙල උප කාර්යාල සීමාව තුළ බලවින්න ග්‍රාමයේ පිහිටි කටුපිලහඩුවවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. එස්. ශාන්ත විසින් සකසන ලද 2000.09.14 දිනැති හා අංක 1497 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 20ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 199/288 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-80/3

මහජන බැංකුව - කිරුළපන ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2006.11.14 වැනි දිනැති අංක 3891 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මලවි ආරච්චිගේ රත්නසිරි යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී අංක 3891 දරන උකස්කරය යටතේ දැනට රුපියල් දහනව ලක්ෂ දාහතරදහස් තුන්සිය අනූදෙකයි ශත හැටනවයක (රු. 19,14,392.69) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල සහ එකී රුපියල් දහනව ලක්ෂ දාහතරදහස් තුන්සිය අනූදෙකයි ශත හැටනවයක (රු. 19,14,392.69) මුදල සඳහා 2009.04.01 වැනි දින සිට වර්ෂයකට 18.5% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා මහත්මිය විසින් 2006.11.14 වැනි දින සහතික කළ අංක 3891 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුවේ, මොරටුව නගර සභා සීමාව තුළ මෝල්පේ යන ගම පිහිටි වලකඩයාවත්ත එක්කෝ මිල්ලගහවත්ත කියන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. ආර්. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 1157 සහ 1994.09.11 වැනි දින මැන සාදන ලද පිඹුරේ ලොට් 1ඒ දරන කොටසට මායිම්, උතුරට : එම්. රොබට් ජෝශප් හිමිකම් කියන ද සොයිසා පාරේ වරිපනම් අංක 537/6 දරන දේපළ ද, නැගෙනහිරට : අංක 28 දරන ප්ලෑනයේ අංක 2 දරන කට්ටිය සහ අඩි 12ක් පළල පාර ද, දකුණට : ඊ. නිහාල් ප්‍රනාන්දු හිමිකම් කියන වලකඩයාවත්ත හෙවත් මිල්ලගහවත්ත ද, බස්නාහිරට : බී. ආර්. ඩී. මෙන්දිස් හිමිකම් කියන වරිපනම් අංක 84/12 දරන දේපළ ද යන මායිම් තුළ වූ පර්චස් දහතුනයි දශම හතයි පහ (අ. 0. රූ. 0, පර්. 13.75) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේද සමග වේ. (මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2028/119හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී මෝල්පේ යන ගම පිහිටි වලකඩයාවත්ත එක්කෝ මිල්ලගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කළ 1බී දරන කට්ටියට ඉහත කී අංක 1175 දරන ප්ලෑනයේ ප්‍රකාර මායිම්, උතුරට : 1ඒ දරන කට්ටිය ද, නැගෙනහිරට : අඩි 12ක් පළල පාර ද, දකුණට : ඊ. නිහාල් ප්‍රනාන්දු හිමිකම් කියන වලකඩයාවත්ත හෙවත් මිල්ලගහවත්ත ද, මෙම ඉඩමේ 1සී දරන කට්ටිය ද, බස්නාහිරට : 1ඒ දරන කට්ටිය ද යන මායිම් තුළ පූ පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1.0) ක් විශාල ඉඩමේ බිමෙන් ද, (මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2028/120හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී මොල්පේ යන ගම පිහිටි වලකඩයාවත්ත එක්කෝ මිල්ලගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කළ 1සී දරන කට්ටියට ඉහත කී අංක 1175 දරන ප්ලෑනයේ ප්‍රකාර මායිම්, උතුරට : 1බී දරන කට්ටිය ද, නැගෙනහිරට : අඩි 12ක් පළල පාර ද, දකුණට : ඊ. නිහාල් ප්‍රනාන්දු හිමිකම් කියන වලකඩයාවත්ත හෙවත් මිල්ලගහවත්ත ද මෙම ඉඩමේ 1සී දරන කට්ටිය ද, බස්නාහිරට : 1සී දරන කට්ටිය ද යන මායිම් තුළ වූ පර්චස් දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 0.28) ක් විශාල ඉඩමේ බිමෙන් ද, (මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2028/121 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.
12-46

මහජන බැංකුව - මැජෙස්ටික් සිටි ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.27 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න විසින් සහතික කරන ලද 2005.03.16 වැනි දින අංක 1457 දරන උකස් බැඳුම්කරය මත මහජන බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම, ඉලුක්පිටියේ ගෙදර සංජායනී සමරනායක විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1457 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් එක් මිලියන හතලිස් දහස් නවසිය හැත්තෑ එකයි ශත පනස් පහක් වූ (රු. 10,40,971.55) මුදලක් ඉහත කී ඉලුක්පිටියේ ගෙදර සංජායනී සමරනායක යන අයගෙන් මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

2010.06.30 වැනි දින සිට වෙන්දේසි දිනය දෙක්වා එකී රුපියල් එක් මිලියන හතලිස් දහස් නවසිය හැත්තෑ එකයි ශත පනස් පහක් වූ (රු. 10,40,971.55) මුදලක් මත වර්ෂයකට සියයට පහළොවයි දශම පහක් (15.5%) තවදුරටත් වූ පොළී මුදලක් ද සමග මහජන බැංකුව වෙත අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර (ඇත්නම්) එම ගෙවීම් අඩු කිරීමෙන් පසුව සහ විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග රුපියල් එක් මිලියන හතලිස් දහස් නවසිය හැත්තෑ එකයි ශත පනස් පහක් වූ (රු. 10,40,971.55) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1457 දරන උකස් බැඳුම්කරය මගින් මහජන බැංකුව වෙත උකස්කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, දලුගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දලුගම සහ වේවැල්දූව ග්‍රාමයේ පිහිටියාවූ ද, "තනිපොල්ගහවත්ත සහ පරන වත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1959 ජූලි මස 3 වැනි දින අංක 1560 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 1 සහ ලොට් එච් ද, නැගෙනහිරට : ලොට් අංක 03 ද, දකුණට : ඩී. ඒෆ්. ජේ. පෙරේරා යන අයගේ ඉඩම ද, බටහිරට : පරණවත්ත ද යන මායිම් ඇතුළත පිහිටා ඇත්තා වූ ද එකී අංක 1560 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම තුනයි හතක් වූ (අ. 0, රූ. 0, පර්. 19.37) කොළඹ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සී 505/327 යටතේ ලියාපදිංචි වී ඇත්තාවූ ද, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

තවද ඉහත කී ඉඩමට පහත සඳහන් මාර්ගය සඳහා වෙන්කළ ඉඩම හරහා සහ ඒ මතින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් සමාන අයිතිවාසිකම් ද ඇතුළත් වේ. එම ඉඩම් වනුයේ -

1. ඉහත කී දලුගම සහ වේවැල්දූව පිහිටා ඇත්තා වූ ද "තනිපොල්ගහ වත්ත සහ පරන වත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ (හුණුපිටිය අලුත්පාර දෙසට දිවෙන) ඉහත කී අංක 1560 දරන පිඹුරේ ලොට් අංක "සී " ලෙස ලකුණු කර ඇත්තා වූ, උතුරට : රජයේ ඉඩම සහ ලොට් අංක 28 සිට 30 දක්වා ඉඩම් කැබලි ද, ලොට් අංක 36 සිට 42 දක්වා වූ ඉඩම් කැබලි සහ ලොට් බී ද, නැගෙනහිරට : මාර්ගය ද, දකුණට : ලොට් අංක 5 සිට 9 දක්වා කැබලි "ඒෆ් " ලොට් 24 සිට 27 දක්වා කැබලි, ඒ සහ ඊ මෙන්ම ලොට් 15 සිට 19 දක්වා කැබලි ද, බටහිරට : ලොට් "එච්" ද යන මායිම් තුළ පිහිටියාවූ ද ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම හතරයි තුනක් වූ (අ. 0, රූ. 1, පර්. 23.43) සී 625/197 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ.

2. ඉහත කී දලුගම සහ වේවැල්දූව පිහිටා ඇත්තාවූ ද "තනිපොල්ගහ වත්ත සහ පරන වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ඉහත කී අංක 1560 දරන පිඹුරේ (මාර්ගයක් සඳහා වෙන් කළ කොටසක් වූ) ලොට් ඊ ලෙස ලකුණු කර ඇත්තා වූ උතුරට : ලොට් සී ද, නැගෙනහිරට : ලොට් අංක 12, 20, ඒ සහ සී ද, දකුණට : ලොට් අංක 11 ද, බටහිරට : ලොට් 21, 27 සහ ඒෆ් ද යන මායිම් තුළ පිහිටියා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතයි පහක් වූ (අ. 0, රූ. 0, පර්. 11.75) සී 467/221 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

3. ඉහත කී දලුගම සහ වේවැල්දූව පිහිටා ඇත්තාවූ ද, "තනිපොල්ගහ වත්ත සහ පරන වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ඉහත කී අංක 1560 දරන පිඹුරේ (මාර්ගයක් සඳහා වෙන්කළ කොටසක්වූ) ලොට් " එච්" ලෙස ලකුණු කර ඇත්තා වූ උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් සී ද, දකුණට : ලොට් 2, 3 සහ 4 ද. බටහිරට : ලොට් 1 ද යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතයි පහක් වූ (අ 0, රූ. 0, පර්. 15.75) අංක සී 495/149 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කලාපීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.
12-44

මහජන බැංකුව - මැජෙස්ටික් සිටි ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.28 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ විසින් සහතික කරන ලද 2008.09.18 වැනි දින අංක 8248 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වන්නිආරච්චිගේ ජානක සුරංග ද කොස්තා මහතා සහ වන්නිආරච්චිගේ ජෙසෙපින් එලිසබෙත් පොන්සේකා මහතා විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 8248 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් මිලියන තුනක් (රු. 30,00,000) මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

2009.03.25 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා එකී රුපියල් මිලියන තුනක් වූ (රු. 30,00,000) වර්ෂයකට සියයට විසිතුනක (23%) මුදලක් මත තවදුරටත් වූ පොලියක් ද සමග අනනතුරුව කිසියම් මුදලක් ගෙවා ඇත්නම් එම මුදල අඩු කිරීමෙන් පසුව සහ විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග එකී රුපියල් මිලියන තුනක් වූ) (රු. 30,00,000) මුදලක් අයකර ගැනීම සඳහා 2008.09.18 වැනි දින අංක 8248 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු වන අර්වින් පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ කලුබෝවිල හෙවත් දැන් නුගේගොඩ මෙල්ඩර් පෙදෙසේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් සාදන ලද 1986.02.08 දින අංක 1628 දරන පිඹුරේ නුගේගොඩ ආනන්ද පාරේ වරිපනම් අංක 26 දරන පදිංචි නිවස ද සමග "හික්ගහවත්ත පයිරුගහවත්ත සහ පයිරුගහවත්ත පලු ඕවිට" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක සී ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක බී ද, නැගෙනහිරට : ආනන්ද පාර ද, දකුණට : ලොට් අංක ඩී ද, බටහිරට : ලොට් ඒ සහ බී ද යන මායිම් තුළ පිහිටියාවූ ද දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එම් 2566/107 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම අටයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 7.81) ඉහත කී ලොට් අංක සී නමැති බෙදා වෙන් කරන ලද ඉඩම වූ ද,

බලයලත් මිනින්දෝරු පී. ඒ. එස්. ඩී. ඩී. පෙරේරා විසින් සාදන ලද 2006.03.24 දින අංක 556 දරන මෑත කාලීන මිනින්දෝරු පිඹුරෙහි පහත දැක්වෙන ආකාරයට විස්තර කර අත්තාවූ ද එනම්-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත නුගේගොඩ මෙල්ඩර් වීදියෙහි පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු පී. ඒ. එස්. ඩී. පෙරේරා විසින් සාදන ලද 2006.03.07 වැනි දින දරන අංක 556 දරන පිඹුරේ නුගේගොඩ, ආනන්ද මාවතේ වරිපනම් අංක 26 දරන පදිංචි නිවස ද, සමග "හික්ගහවත්ත පයිරුගහවත්ත සහ පයිරුගහවත්ත පලු ඕවිට" යනුයෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක එක්ස් ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වාගේ අංක 1628 දරන පිඹුරේ ලොට් අංක බී ද, නැගෙනහිරට : ආනන්ද මාවත ද, දකුණට : අංක 1628 දරන පිඹුරේ ලොට් අංක බී ද, බටහිරට : අංක 1628 දරන පිඹුරේ ලොට් ඒ සහ ඩී ද යන මායිම් තුළ පිහිටියාවූ ද, දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එම් 2566/107 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම අටයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 7.81) ඉහත කී ලොට් අංක එක්ස් නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කලාපීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.
12-45

මහජන බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. ජී. ජයසූරිය විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.04.23 දිනැති අංක 499 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නුගේගොඩ, ගංගොඩවිල, සෝරත මාවතේ, රබර්වත්ත පාරේ අංක 36/2 දරන ස්ථානයෙහි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන්නාවූ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන සීමාසහිත ලිතාකා ස්ටේෂණරීස් (පෞද්ගලික) සමාගම සහ විජේසුන්දර මුදියන්සේලාගේ ඉඳුනිල් සුජීව යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී අංක 499 දරන උකස්කරය මත රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හත්සිය පනහයි ශත පනස්පහක (රු. 4,63,750.55) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද,

2009.04.24 වැනි දින සිට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හත්සිය පනහයි ශත පනස්පහක (රු. 4,63,750.55) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හත්සිය පනහයි ශත පනස් පහක (රු. 4,63,750.55) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී 2007.04.23 දිනැති අංක 499 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇතිබ බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව ගමේ වත්තේගෙදර පාරේ පිහිටා ඇති වරිපනම් අංක 255/7 දරන පෙළෙන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් 1998 ජනවාරි මස 20 වැනි දින මැන සාදන ලද අංක 546 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 9" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 546 දරන එකී පිඹුරේ ලොට් 8 ද, නැගෙනහිරට : ලොට් 15 (අඩි 15 පළල පාර) ද, දකුණට : අංක 546 දරන එකී පිඹුරේ ලොට් 10 සහ බටහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 1997 ජූලි මස 02 වැනි දින මැන සාදන ලද අංක 2076B දරන පිඹුරේ ලොට් 1A2 යන මෙකී මායිම් තුළ පිහිටි, එකී අංක 546 දරන පිඹුරට අනුව පර්චස් අටයි දශම දෙකයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 8.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි ආදී සියලු දේද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2820/41 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කොටස මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී බොරලැස්ගමුව ගමේ වත්තේගෙදර පාරේ පිහිටා ඇති "පෙළෙන්ගහවත්ත" නමැති ඉඩමේ ඉහත කී අංක 456 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 15" (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කර ඇත) දරන කොටසට මායිම්, උතුරට : වත්තේගෙදර පාර සහ එකී අංක 546 දරන පිඹුරේ මෙම ඉඩමේ ලොට් 6 ද, නැගෙනහිරට : ලොට් 4, 5. 14, 2 සහ එකී අංක 546 දරන පිඹුරේ මෙම ඉඩමේ ලොට් 6 ද, දකුණට : අංක 456 දරන එකී පිඹුරේ මෙම ඉඩමේ ලොට් 13, 12, 11 සහ 10 සහ බටහිරට : අංක 546 දරන එකී පිඹුරේ මෙම ඉඩමේ ලොට් 9, 8, 7, 1, 6 සහ 3 ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 546 දරන පිඹුර අනුව පර්චස් විස්සයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.50) හෝ (හෙක්ටයාර් 0.0519) විශාල ඉඩම මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2609/249 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය
(බස්නාහිර කලාපය - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.
12-47

මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

නුවරඑළියේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. ඩී. නානායක්කාර විසින් සහතික කරන ලද අංක 2457 සහ 2006.10.25 දින දරන උකස්කරය හා නුවරඑළියේ ප්‍රසිද්ධ නොතාරිස් ජයමිණි අඹගහවත්ත විසින් සහතික කරන ලද අංක 685 හා 2007.10.16 දින දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම, රාතම ගෙදර රත්නායක මුදියන්සේලාගේ අබේකෝන් රත්නායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට පිළිවෙලින් රුපියල් මිලියන එකකුත් තුන් ලක්ෂ හතලිස් දහසක් (රු. 13,40,000) සහ රුපියල් දෙලක්ෂ පනස් හතර දහස් හයසිය තුනකුත් ශත හතලිස් එකක (රු. 2,54,603.41) මුදලක් දැනට අයවිය යුතු බැවින් ද, පිළිවෙලින් 2008.11.25 වැනි දින සිට වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් රුපියල් මිලියන එකකුත් තුන්ලක්ෂ හතලිස් දහසක් (රු. 13,40,000) මුදලක් හා 2009.08.27 වැනි දින සිට වර්ෂයටක සියයට විසිහය (26%) බැගින් රුපියල් දෙලක්ෂ පනස්හතර දහස් හයසිය තුනකුත් ශත හතලිස් එකක (රු. 2,54,603.41) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් මිලියන එකකුත් තුන්ලක්ෂ හතලිස්දහසක් (රු. 13,40,000)සහ රුපියල් දෙලක්ෂ පනස් හතර දහස් හයසිය තුනකුත් ශත හතලිස් එකක (රු. 2,54,603.41) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ 5, හැව්ලොක් පාරේ අංක 250හි බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2457 හා 685 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ හා කොට්ඨාසයේ, නුවරඑළිය නගර සභා සීමාව තුළ වරිපනම් අංක 45 (මීන් පෙර වරිපනම් අංක 116) දරන ලද කැලෑගල්ලේ ග්‍රාමයේ පිහිටි "ලෝවර් ගිබ්සන් ලෑන්ඩ්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 10690 හා 1992.06.27 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 01 වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන් කළ හා නිරූපිත ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ඩී. ඒ. සමරසිංහගේ දේපළ ද, නැගෙනහිරට : කැබලි අංක 03 ද, වඩාත් නිවැරදිව කැබලි අංක 2 හා 3 ද, දකුණට : ලෝවර් ගිබ්සන් පාර ද, බටහිරට : එස්. එච්. ප්‍රනාන්දුට අයිති දේපළ ද යන මායිම් තුළ පිහිටි වපසරිය පර්චස් හතයි දශම බින්දුවයි තුනයි (අ. 0, රූ. 0, පර්. 7.03) හෝ හෙක්ටයාර් 0.0185 වඩාත් නිවැරදිව පර්චස් හතයි දශම තුනයි (පර්. 7.3) වන භූමිය සමග ඒ මත පිහිටි සෑම සියළු දේත් වන අතර. නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A35/217 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 40, උද්‍යාන පාර,
නුවරඑළිය.
12-48

සෙලාන් බැංකුව පීඑල්සී - කුඩා සහ මධ්‍යම පරිමාන ව්‍යවසායකත්ව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010 සැප්තැම්බර් මස 29 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0014-02238114-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. තෙපුලන්ගොඩ විසින් සහතික කරන ලද 2006 අගෝස්තු මස 31 දිනැති අංක 949 දරන බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් 15 දිනැති අංක 1329 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, රාගම, වැලිසර, මීගමුව පාර අංක 310හි මෙසස් වාසනා ට්‍රේඩිං ලංකා (පීවීටී) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හත්කෝටි පනස්දෙලක්‍ෂ පන්දහස් දෙසිය අටයි ශත පනස්අටක (රු. 7,52,05,208.58) මුදලක්, 2010 පෙබරවාරි මස 16 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුය සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 7,52,05,208.58 මුදල ද, 2010 පෙබරවාරි මස 17 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 949 සහ 1329 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි සහ දෙවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ කඳාන උපකාර්යාලය තුල නාගොඩ පිහිටි තොටගාවා කුඹුර හෙවත් තොටුපොල කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග කුඹුරට මායිම්, උතුරට : අලගියදුර ලවාරිස් ප්‍රනාන්දුගේ කුඹුරේ මායිම් වේල්ල ද, නැගෙනහිරට : මියගිය සාම නිලධාරී හිද්දාදුර කොර්නේලිස් මැන්දිස්ගේ උරුමක්කරුවන්ගේ සහ තවත් අයගේ ඉඩම් වෙන් කෙරෙන අගල ද, දකුණට : ඇල සහ බස්නාහිරටඃ ඇල යන මායිම් තුළ වී බෙර දහඅටක පමණ වපසරිය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 143/123හි ලියාපදිංචි කර ඇත.

එකී වී බෙර දහඅටක් පමණ වන වපසරිය ඇති කුඹුර අංක 4003 දරන සැලැස්ම අනුව පසුව මැනීමක දී පහත සඳහන් පරිදි විස්තර කර සහ මායිම් කර ඇත :

පෙර කී නාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2005 ජුනි 21 දිනැති අංක 4003 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන තොටගාවා කුඹුර හෙවත් තොටුපොල කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග මොරවත්ත පාර වරිපනම් අංක 158/2 දරන කුඹුරේ ලොට් එක්ස් ලකුණු කළ ඉඩම් කොටසට මායිම් උතුරට : මියගිය අදිරියන් ප්‍රනාන්දුගේ කුඹුර ද, නැගෙනහිරට : පිට ඇල (අඩි 6ක් පළල) ද, දකුණට : පිට ඇල (අඩි 6ක් පළල) සහ ඇල සහ බස්නාහිරට : මහාමාර්ග දිගේ වෙන්කිරීම (මැද සිට අඩි 150ක්) යන මායිම් තුළ එකී අංක 4003 දරන සැලැස්ම අනුව අක්කර හතරයි, රූඩ් එකයි, පර්චස් තිස් අටයි දශම පහයි බිංදුවක් (අ. 4, රූ. 1, පර්. 38.50) ක් විශාල ඉඩම.

ලොට් ඒ2 සහ බී2 ලකුණු කළ පාර සඳහා වෙන්කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සහ පහසුකම් සමග සහ මෙහි මින්මතු විස්තර කරනු ලබන අඩි 6ක් පළල පිට ඇල මෙහි මින් පෙර විස්තර කරන ලද එකී ලොට් එක්ස් බුක්තිවිඳීමේ අයිතිය හා සම්බන්ධ සියලු කාරණා සඳහා වෙනත් අය සමග පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය සමග.

1. පෙර කී නාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2005 පෙබරවාරි මස 08 දිනැති අංක 3645 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොරකගහවත්ත නමැති, ඉඩමේ ලොට් ඒ2 ලකුණ කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කිරීම) ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩම සහ ජෝජ් ප්‍රනාන්දුගේ සහ තවත් අයගේ කුඹුර අතර පිට ඇල ද, නැගෙනහිරට : ලොට් ඒ1 ද, දකුණට : ලොට් බී2 සහ බස්නාහිරට : කුමාරි ප්‍රනාන්දුගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 3645 දරන සැලැස්ම අනුව පර්චස් හතරක් (අ. 0, රූ. 0, පර්. 04.00) ක් විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 581/145හි ලියාපදිංචි කර ඇත.

2. පෙර කී නාගොඩ පිහිටි පෙර කී අංක 3645 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොරකගහවත්ත නමැති, ඉඩමේ ලොට් බී 2 ලකුණු කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කිරීම) ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් ඒ 2 ද, නැගෙනහිරට : ලොට් බී 1 ද, දකුණට : මොරවත්ත පාර සහ බස්නාහිරට : කුමාර් ප්‍රනාන්දුගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 3645 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 06.40)ක් විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 456/257හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 4003 දරන සැලැස්මේ නිරූපනය වන අඩි 6ක් පළල පිට ඇල වෙනත් අය සමග පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය සමග.

දෙවැනි උපලේඛනය

පෙර කී වැලිසර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 09 දිනැති අංක 5156 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන තලහේනවත්ත සහ කිවුල්හන්දිරම් කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඉසෙඩ් ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1685ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ, කලින් එම්. පී. පෙරේරාගේ ඉඩම සහ ඩී. පී. පෙරේරාගේ මෙම කුඹුරේ කොටස ද, නැගෙනහිරට : පිට ඇල (අඩි 10ක් පළල) ද, දකුණට : දෙපා ඇල, සීමාසහිත ඒට්කන් ස්පෙන්ස් සමාගමේ දේපළ, සීමාසහිත එන්. එස්. සමාගමේ දේපළ සහ අළුත් ඇල (අඩි 14ක් පළල) සහ බස්නාහිරට : මීගමුව පාර, අංක 1685ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ යන මායිම් තුළ

එකී අංක 5156 දරන සැලැස්ම අනුව අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විසිහයයි දශම අටයි බිංදුවක් (අ. 1, රූ. 1, පර්. 26.80) ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සී. කොට්ගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

12-77/2

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිවි 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 457157.

හොලොඹුවලගේ සරත් ප්‍රේමචන්ද්‍ර.

2010 ජූලි මස 30 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 2008 ජූනි මස 16 වැනි දින අංක 6177 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ හොලොඹුවලගේ සරත් ප්‍රේමචන්ද්‍ර බන්ධනදායී/උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ පනස්පන්දහස් නවසිය තිස් දෙකයි ශත විසි එකක (රු. 8,55,932.21) මුදලක් 2010 මැයි මස 07 වැනි දින වීට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ පනස්පන්දහස් නවසිය තිස් දෙකයි ශත විසි එකක (රු. 8,55,932.21) මුදල හා 2010 මැයි මස 08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,61,065.38ක මුදලක් සඳහා වාර්ෂිකව 19% බැගින් වූ පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අයකර ගැනීම සඳහා එකී අංක 6177 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තු ඕතොට කෝරළයේ, උඩපොල ගල්බඩගම ගමේ පිහිටි මොරේවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. එම්. තිලකරත්න විසින් 2007.12.02 වැනි දින අංක 7082 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 2 නමැති ඉඩමට මායිම්, එනම් උතුරට : කොළඹ පාරේ සිට පොල්ගහවෙලට දිස්වෙන පාරෙන් ද (නව කොළඹ පාර), නැගෙනහිරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද හා බස්නාහිරට : එච්. එම්. එල්. බී. හේරත්ට අයත් ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය, පර්චස් තිහයි (අ. 0, රූ. 0, පර්. 30). මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F1815/211හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

12-132

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව වෙනුවෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2005 නොවැම්බර් මස 24 වැනි දින අංක 23320 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගම්පහ, පදිංචි ගමිලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 ජූලි මස 31 වැනි දිනට ඉහත කී ගමිලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් මිලියන දෙකයි හාරලක්ෂ අනූහතර දහස් දෙසිය දහනවයයි ශත විසිනවයක් වූ (රු. 24,94,219.29) මුදලක් සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් මිලියන දෙකයි එක්ලක්ෂ විසිහතර දහස් නවසිය අසූ පහක් (රු. 21,24,985) වූ මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතයි දශම පහක (7.5%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී අංක 23320 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් මිලියන දෙකයි හාරලක්ෂ අනූහතරදහස් දෙසිය දහනවයයි ශත විසිනවයක (රු. 24,94,219.29) මුදල සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් මිලියන දෙකයි එක්ලක්ෂ විසිහතර දහස් නවසිය අසූපහක් (රු. 21,24,985) වූ මුදල සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතයි දශම පහක (7.5%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව ඉහත කී උකස් බැඳුම්කරයේ නියමයන්ට අනුව ඩී. එෆ්. සී. සී බැංකුව විසින් වැයකර ඇති මුදල් සහ දරන ලද සියලු වියදම් සහ ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23320 දරන උකස් බැඳුම්කරය මගින් ගමිලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත සවිස්තර ලෙස විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඉොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුල්‍ය සංස්ථාව පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

අංක 23320 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, මහර ඌරුවල්පේරුව ප්‍රාදේශීය සභාවේ අංක 3 දරන උප කාර්යාල සීමාව තුළ අඹගස්පිටියේ පිහිටා ඇත්තාවූ ද "අස්වැද්දමේ කුඹුර" සහ "යාබද පිල්ලෑව" යනුවෙන් හඳුන්වනු ලබන්නාවූ ද බලයලත් මිනින්දෝරු එස්. පී. එන්. සඳගිරි විසින් සාදන ලද 2004.07.17 දින අංක 1074 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණුකර ඇත්තාවූ ද, උතුරට : ඩී. පී. ප්‍රේමරත්න විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, නැගෙනහිරට : බී. චන්ද්‍රලතා සහ තවත් අය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, දකුණට : යක්කල කිරිඳිවල ප්‍රධාන මාර්ගය ද, බටහිරට : ඩී. නිමලසිරි, තුසිත ජයන්ත්මාල් සහ බී. පියසීලි යන අය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද යන මායිම් තුළ පිහිටියාවූ ද, ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඊ 759/42 දරන පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද එකී අංක 1074 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස්හයයි දශම එකක් වූ ද (අ. 0, රූ. 0, පර්. 36.1) වූ ද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.
12-98/2

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදී)
යොවන කටයුතු අමාත්‍යාංශය

ග්‍රැෆික්ස් සහ මල්ටි මීඩියා පාඨමාලා 2010/2011
COURSES IN GRAPHICS & MULTI MEDIA 2010/2011

පරිගණක ආශ්‍රිත ග්‍රැෆික්ස් නිර්මාකරණය
COMPUTER GRAPHIC DESIGN

ග්‍රැෆික්ස් මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇත. ඒ තුළින් අද ග්‍රැෆික්ස් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් දැනුමක් හා පුහුණුවක් ලබා දෙන අතර එම මෘදුකාංග ආධාරයෙන් විචිත්‍ර නිර්මාණ කරන අයුරු මැනවින් පැහැදිලි කර දෙයි. මෙම පාඨමාලාව මගින් පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද පුළුල් පරාසයක දැනුමක් හා පුහුණුවක් ලබා දේ.

කාලය: මාස 04 මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි ගාස්තුව රු. 12,250.

අරේබීය සංස්කරණය
NON LINEAR EDITING

මෙම පාඨමාලාව තුළින් වීඩියෝ, රූපවාහිනී සහ චලන චිත්‍රපට සංස්කරණය පිළිබඳ පුළුල් පරාසයක පුහුණුවක් හා දැනුමක් ලබාදේ. වීඩියෝ රූපවාහිනී සහ චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 04, මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි ගාස්තුව රු. 17,750

පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම
COMPUTER TYPESETTING & LAYOUT DESIGNING

ග්‍රැෆික්ස්, මුද්‍රණ සහ සන්නිවේදන ආයතන (communication bureaus) වල රැකියා බලාපොරොත්තුවන පාසැල් හැරගිය සිසුන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. මෙම පාඨමාලාව තුළින් පරිගණක අකුරු ඇමිණීම සහ පිටු සැකසීම පිළිබඳ නූතනයේ භාවිතා වන පරිගණක මෘදුකාංග පිළිබඳ පුළුල් පරාසයක දැනුමක් හා පුහුණුවක් ලබා දේ.

කාලය : මාස 05, මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි ගාස්තුව රු. 9,750

පොත් බැඳීම හා නිමාකරණය
BOOK BINDING & FINISHING

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර බඳවා ගනු ලබන්නේ සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණි. මෙම පාඨමාලාව තුළින් පොත් බැඳීම සහ නිමාව පිළිබඳ පුළුල් ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදෙන අතර මෙම ක්ෂේත්‍රයට ඇතුළුවීමට අදහස් කරන පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 08, මාධ්‍ය : සිංහල ගාස්තුව රු. 11,250

ද්විමාන හා ත්‍රිමාණ සජීවිකරණය
2D & 3D ANIMATION

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින සජීවිකරණ මෘදුකාංග ඇසුරෙන් ද්විමාන සහ ත්‍රිමාන චලන රූප නිර්මාණය කර ඒවා චිත්‍රපට රූපවාහිනී සහ වෙනත් වීඩියෝ මාධ්‍යයන්ට භාවිතා කිරීම පිළිබඳව පුළුල් පරාසයක පුහුණුවක් හා දැණුමක් ලබා දේ. මේ සඳහා උනන්දුවක් දක්වන නවකයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයන්හි නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 06, මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි ගාස්තුව රු. 17,750

මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍ර සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පාඨමාලාව
ENGLISH LANGUAGE SKILLS FOR PRINTING, GRAPHICS AND MULTIMEDIA INDUSTRY

මෙම පාඨමාලාව මුද්‍රණ ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රවල නියුතු පුද්ගලයන්ට තමන්ගේ වෘත්තිමය සහ පුද්ගලික ජීවිතයට අදාල ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හසල දැනුමක් ලබාදීම සඳහා විශේෂයෙන් සැලසුම් කර ඇත.

කාලය : මාස 05, පාඨමාලා ගාස්තුව රු. 7500/-
සියළු පාඨමාලා සඳහා රු. 250ක ඇතුළත්වීමේ ගාස්තුවක් අයකෙරේ.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස් කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන් හට රජය පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

විමසීම් - ප්‍රධාන කාර්යාලය
ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක. 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162
ඊමේල් : sliopreg@sltnet.lk
බේරුවල ශාඛාව - 0342279881/0715894946
මාතලේ ශාඛාව - 0662222172/0714895044

ශාඛා:
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බේරුවල,
දුරකතනය - 0342279881/0715894946

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දිසා ලේකම් කාර්යාලය - මාතලේ,
දුරකතනය - 0662222172/0714895044

වෙබ් අඩවිය: www.sliop.com